අධ්‍යාපන අමාත්‍යාංශය
கல்வி அமைச்சு
Ministry of Education

'ඉසුරුපාය', බත්තරමුල්ල, ශ්‍රී ලංකාව.
'இசுருபாய', பத்தரமுல்ல, இலங்கை.
'Isurupaya', Battaramulla, Sri Lanka.
+94112785141-50 +94112785818
info@moe.gov.lk www.moe.gov.lk

මගේ යොමුව / எனது இல. / My Ref. ED/05/84/10/09-2019
ඔබේ යොමුව / உமது இல. / Your Ref.
දිනය / திகதி / Date 2019.04. 25

පාර්ලිමේන්තුවේ මහලේකම්,
රාජ්‍ය ගිණුම් පිළිබඳ කාරක සභාව,
ශ්‍රී ලංකා පාර්ලිමේන්තුව,
ශ්‍රී ජයවර්ධනපුර කෝට්ටේ.

**<u>පාර්ලිමේන්තුවේ රජයේ ගිණුම් පිළිබඳ කාරක සභාව විසින් පාර්ලිමේන්තුවට ඉදිරිපත් කරන ලද වාර්තාව පිළිබඳ නිරීක්ෂණ සහ ගනු ලැබූ පියවරයන් පාර්ලිමේන්තුව වෙත ඉදිරිපත් කිරීම.</u>**

උක්ත කරුණ සම්බන්ධයෙන් ඔබ විසින් මා වෙත යොමු කර ඇති 2019.02.22 දිනැති ලිපිය හා බැඳේ.

02. ඒ අනුව 2019.02.21 වන දින පාර්ලිමේන්තුව හමුවේ සභාගත කරන ලද රජයේ ගිණුම් පිළිබඳ කාරක සභාවේ පාර්ලිමේන්තු ප්‍රකාශනමාලා අංක 57 දරණ වාර්තාවේ අධ්‍යාපන අමාත්‍යාංශයට අදාල කරුණු සම්බන්ධයෙන් ගෙන ඇති පියවරයන් හා මාගේ නිරීක්ෂණ මේ සමඟ ඉදිරිපත් කරමි.

අකිල විරාජ් කාරියවසම්
අධ්‍යාපන අමාත්‍ය
අධ්‍යාපන අමාත්‍යාංශය

පාර්ලිමේන්තු ප්‍රකාශන මාලා අංකය :-**57**

ආයතනයේ නම :- අධ්‍යාපන අමාත්‍යාංශය

| | කමිටුව විසින් හඳුනාගත් අඩුපාඩු සහ දෙන ලද නියෝග | කමිටුව විසින් හඳුනාගත් අඩුපාඩු නිවැරදි කිරීම සඳහා ගෙන ඇති ක්‍රියාමාර්ග සහ නිර්දේශ ක්‍රියාත්මක කිරීමේ වර්තමාන තත්වය |
|---|---|---|

**අධ්‍යාපන අමාත්‍යාංශය**
**2017 නොවැම්බර් 17**

1. **ජාතික ගුරු මාරු කිරීමේ ප්‍රතිපත්තියෙහි වර්තමාන ප්‍රගතිය**

පළාත් සභාවල මෙම ප්‍රතිපත්තිය ක්‍රියාත්මක වන බවත් අවු. 10ට වැඩි එකම ස්ථානයේ සේවය කරන ලද ගුරුවරුන් අතුරින් උසස් පෙළ ගුරුමාරු සිදුකර ඇති බවත් සාමාන්‍ය පෙළ හා ප්‍රාථමික ගුරුමාරු 2018 ජනවාරි මස වනවිට පාසල් පද්ධතියට හා ජාතික ගුරුමාරු ප්‍රතිපත්තියට හානියක් නොවන ලෙස සිදු කරන බවත් ප්‍ර.ග.නි. පැවසීය. වාර්ෂික ගුරුමාරු කිරීම් ද ක්‍රමානුකූලව සිදුවන බව ප්‍ර.ග.නි. වැඩිදුරටත් පැවසීය.

2018 හා 2019 වර්ෂයන්ට අදාළව ජාතික පාසල් වෙතින් ලැබී ඇති වාර්ෂික අයදුම්පත්‍ර හා වසර 10ට වැඩි ගුරු ස්ථානමාරු අයදුම්පත්‍ර, ගුරු ස්ථානමාරු මණ්ඩලයක් මගින් පරීක්ෂා කර බලා විෂයන් අනුව හා පවතින ගුරු පුරප්පාඩු මත ගැලපීම් සිදුකර ස්ථානමාරු සිදුකළ ගුරු සංඛ්‍යා පිළිබඳ තොරතුරු පහත දක්වා ඇත.

| | 2018 | | | 2019 | | |
|---|---|---|---|---|---|---|
| | වාර්ෂික | දස අවුරුදු | මුළු | වාර්ෂික | දස අවුරුදු | මුළු |
| මුළු අයදුම්පත් සංඛ්‍යාව | 2,902 | 10,589 | 13,491 | 4,826 | 2,400 | 7,226 |
| ස්ථානමාරු කළ සංඛ්‍යාව | 1,165 | 7,199 | 8,364 | 1,440 | 1,210 | 2,650 |
| ස්ථානමාරු කළ ප්‍රතිශතය | **40%** | **60%** | **62%** | **30%** | **51%** | **37%** |

ඒ අනුව එකම ජාතික පාසලේ සේවා කාලය වසර 10ට වැඩි වුව ගුරුභවතුන් අතරින් විෂයට අදාළව අනුප්‍රාප්තිකයන් ගලප ගැනීමේ අපහසුතාවය, ප්‍රාදේශීයව පිහිටි හුදෙකලා පාසල්වල ගුරුභවතුන් වෙනුවෙන් අනුප්‍රාප්තිකයෙකු ගලපා ගත නොහැකි වීම මත හා නිර්දේශිත වයස් සීමාව ඉක්ම වීම මත, ස්ථානමාරු කිරීමට නොහැකි වූ ගුරුභවතුන් ප්‍රමාණයක් වාර්ෂිකව පාසල් වල ඉතිරි වන අතර විෂයට අදාළව අනුප්‍රාප්තිකයන් ගැලපීම මගින් එම ගුරුභවතුන් ද ඉදිරියේදී ස්ථානමාරු කිරීමට නියමිතය.

2. **2008 සිට 2017 ඔක්තෝබර් 30 දින දක්වා කාල පරිච්ඡේදය තුලදී පාසල් පද්ධතියේ සිදු වූ අක්‍රමිකතා හා අවිනය ක්‍රියා හේතුවෙන් ඇති වූ ගැටළු**

මේ පිළිබඳ විධිමත් විනය පරීක්ෂණයක් සිදු කිරීමට පරීක්ෂණ නිලධාරීන්ගේ හිඟයක් පවතින බව ප්‍ර.ග.නි. පැවසීය. මේ සම්බන්ධව ප්‍රථමයෙන් අභ්‍යන්තර විමර්ශන සිදු කරන ලෙසත් 2008 සිට පවතින ප්‍රශ්න, විසඳු/නොවිසඳු ලෙස වර්ගීකරණය කර දින වකවානු සහිතව සාරාංශගත වාර්තාවක් දෙසැම්බර් 15ට පෙර ලබා දෙන ලෙස කාරක සභාව නියෝග කළේය.

❖ අධ්‍යාපන අමාත්‍යාංශය යටතේ දිවයින පුරා විහිදී පවතින ජාතික පාසල්, විද්‍යාපීඨ, ගුරු විද්‍යාල හා අමාත්‍යාංශයේ සේවයේ නියුතු නිලධාරීන් සම්බන්ධව ලැබෙන පැමිණිලි මෙන්ම අභ්‍යන්තර විගණන අංශය මඟින් සිදු කර ඇති විගණන පරීක්ෂණ ද සම්බන්ධ විමර්ශන කටයුතු වලට අදාළව ආයතන සංග්‍රහයේ XLVIII වන පරිච්ඡේදයට අනුව මූලික විමර්ශන සිදු කිරීම හා චෝදනා පත්‍ර කෙටුම්පත් කිරීමේ කටයුතු විමර්ශන නිලධාරි සතු කාර්යය භාරයකි. ඒ සඳහා අධ්‍යාපන අමාත්‍යාංශය සතු විමර්ශන නිලධාරි සංචිතය ඉතා කුඩා ප්‍රමාණයක් වන බැවින් විමර්ශන නිලධාරි තනතුරු ප්‍රමාණය වැඩි කර ගැනීම සඳහා කළමනාකරණ සේවා දෙපාර්තමේන්තුවේ අනුමැතියට යොමු කර ඇත.

- ❖ විමර්ශන නිලධාරි පත්වීම් ලිපියෙහි විමර්ශනය අවසන් කර වාර්තාව ලබා දිය යුතු කාලය නිශ්චිතව දක්වා ඇති අතර එම කාලය ඉක්මවා යන බවක් නිරීක්ෂණය වන විට දුරකථන මාර්ගයෙන් හෝ සිහිපත් යොමු කිරීම තුළින් හෝ විමර්ශන කටයුතු කඩිනම් කිරීමට පියවර ගෙන ඇති අතර තවදුරටත් විමර්ශනය ප්‍රමාදවන්නේනම් අතුරු වාර්තාවක් හෝ ලබා දෙන ලෙස විමර්ශන නිලධාරින් දැනුවත් කර ඇත.

- ❖ විමර්ශනයෙන් අනාවරණය වූ කරුණු සම්බන්ධයෙන් ආයතන සංග්‍රහයේ II කොටසේ විධිවිධාන ප්‍රකාර පළමු උපලේඛනයේ සඳහන් වරදවල් සඳහා සහ දෙවන උපලේඛනයේ සඳහන් වැරදිවල් සඳහා චෝදනා පත්‍ර නිකුත් කර විධිමත් විනය පරීක්ෂණ සිදු කිරීම.

- ❖ විමර්ශන නිර්දේශ අනුව චෝදනා පත්‍රයක් නිකුත් නොකරනු ලබන අවස්ථාවලදී ලඝු විනය යටතේ අවවාද කිරීම්, ස්ථාන මාරුකිරීම් සිදුකර විනය කටයුතු අවසන් කිරීම.

- ❖ මූලික විමර්ශනයක් සිදු නොකරන සෑම පැමිණිල්ලක් සම්බන්ධයෙන්ම ඒ පිළිබඳව විදුහල්පති/ පළාත් අධ්‍යාපන අධ්‍යක්ෂ / කලාප අධ්‍යාපන අධ්‍යක්ෂ වෙතින් වාර්තා කැඳවා එම පැමිණිලි සම්බන්ධයෙන් කටයුතු කිරීම.

- ❖ කෙසේ වුවද පරීක්ෂණ නිලධාරින් පත් කිරීමෙන් පසු විධිමත් විනය පරීක්ෂණ වාර්තාව ලබා දීම සම්බන්ධයෙන් අදාල නිලධාරින් වෙත සිහිකැඳවීම් යොමු කර විනය ක්‍රියාමාර්ග කඩිනමින් අවසන් කිරීමට අවශ්‍ය කටයුතු සිදු කරනු ලැබේ.

- ❖ දැනට අවසන් වාර්තා ලබා දී නොමැති නඩු සම්බන්ධයෙන් වන තොරතුරු, අමාත්‍යාංශයේ නීති නිලධාරි/ පළාත් අධ්‍යාපන අධ්‍යක්ෂ/ කලාප අධ්‍යාපන අධ්‍යක්ෂවරු මාර්ගයෙන් අදාළ අධිකරණවල රෙජිස්ට්‍රාර්වරු දැනුවත් කිරීමෙන් එම අවසන් නඩු වාර්තා ලබා ගැනීමට කටයුතු සිදු කරමින් පවතී.

- ❖ රාජ්‍ය සේවා කොමිෂන් සභාවේ කාර්ය පටිපාටික රීති, ආයතන සංග්‍රහය සහ මුදල් රෙගුලාසි, ප්‍රසම්පාදන මාර්ගෝපදේශ, රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ, මුදල් අමාත්‍යාංශ චක්‍රලේඛ, අධ්‍යාපන අමාත්‍යාංශ චක්‍රලේඛ වලට අදාළව කටයුතු කල යුතු ආකාරය පිළිබඳව විදුහල්පතිවරුන් දැනුවත් කිරීම.

- ❖ විනය ක්‍රියාපටිපාටිය පිළිබඳව විදුහල්පතිවරුන් දැනුවත් කිරීම.

- ❖ පාසල් පද්ධතියේ පරිපාලනමය ගැටළු නිරාකරණය කර ගැනීම සඳහා පුහුණු වැඩසටහන් සම්පාදනය කිරීම.

2019.02.28 දිනට විනය ගොනු වල වර්තමාන තත්ත්වය ඇමුණුම 01 මඟින් ඉදිරිපත් කර ඇත.

**3. පහවසර ශිෂ්‍යත්වලාභීන් වෙත පරිගණක වැඩසටහනක් මගින් ශිෂ්‍යාධාර ලබාදීම කඩිනම් කිරීම පිළිබඳ වර්තමාන තත්වය.**

මේ පිළිබඳ මාසයක් තුල වාර්තාවක් ලබා දෙන ලෙස ප්‍ර.ග.නි. වෙතද, මෙම ශිෂ්‍යත්ව ආධාර ඉතිරිවීම් පිළිබඳ විමර්ශනය කර වාර්තාවක් ලබාදෙන ලෙස විගණකාධිපති දෙපාර්තමේන්තුව වෙතද කාරක සභාව විසින් නියෝග කළේය.

05 ශ්‍රේණි ශිෂ්‍යත්ව පරීක්ෂණයෙන් සුදුසුකම් ලබන අඩු ආදායම්ලාභී පවුල්වල දරුවන්ගේ අධ්‍යාපන කටයුතු අතරමඟ නතරවීම වළක්වාලීම පිණිස 06 ශ්‍රේණියේ සිට 13 ශ්‍රේණිය දක්වා රු. 500.00ක මාසික දීමනාවක් ලෙසින් රජය විසින් වසරකට රු. 5000.00 ක ශිෂ්‍යාධාර මුදලක් ප්‍රදානය කරනු ලබයි.

එම ක්‍රියාවලිය මේ වන තෙක් විදුහල්පති විසින් ඉදිරිපත් කරනු ලබන වවුචර්පත් වෙනුවෙන් කලාප අධ්‍යාපන කාර්යාලය හරහා අදාළ සිසුන්ගේ බැංකු ගිණුම් වෙත මුදල් බැර කිරීම සිදු කරන ලදී.

නමුත් එම ක්‍රමයේ දී මාසිකව ශිෂ්‍ය අත්සන් අනිවාර්ය වීම මත පාසල මඟින් වවුචර්පත් කලාප අධ්‍යාපන කාර්යාලයට ඉදිරිපත් කිරීමට දිගු කාලයක් ගතවන අතර ශිෂ්‍ය පැමිණීම තහවුරු කරගැනීමේ දී ඇතිවන ගැටළු හේතුවෙන් ශිෂ්‍යාධාර ප්‍රතිලාභීන්ට හිමි විය යුතු ආධාර මුදල් නිසිපරිදි කාර්යක්ෂමව ගෙවීමේ ගැටළු දිගින් දිගටම නිරීක්ෂණය වී ඇත.

එබැවින් පසුගිය වර්ෂ කිහිපය පුරාම ශිෂ්‍යාධාර සඳහා වෙන්වන මුදල් නිසිපරිදි භාවිතා නොකිරීම හේතුවෙන් අධ්‍යාපන අමාත්‍යාංශය ගැටළු රැසකට මුහුණ දී ඇත.

ඒ අනුව රාජ්‍ය ගිණුම්කාරක සභාවේ ද නිර්දේශ සහිතව 05 ශ්‍රේණි ශිෂ්‍යාධාර ගෙවීම මාර්ගගත වැඩසටහනකින් (Online Programme) ගෙවීම සඳහා කටයුතු කිරීමට තීරණය කරන ලද අතර ඒ සඳහා පාසල් කටයුතු ශාඛාව හඳුනාගත් සම්පත්දායකයෙකු විසින් නොමිලයේ ඉටු කරදීමට එකඟතාව පළ කර සුදුසු මෘදුකාංගයක් සකස් කරන ලදී.

එසේ වුව ද, එම කාර්යය සඳහා එම සම්පත්දායකයාගේ දායකත්වයෙන් සකස් කරන ලද වැඩසටහනෙහි ක්‍රියාකාරීත්වය, ආරක්ෂාකාරීත්වය හා පසු සේවා සිදුකිරීම පිළිබඳව සෑහීමකට පත්විය නොහැකි බව නිරීක්ෂණය වන බව තොරතුරු තාක්ෂණ ශාඛාව මඟින් නිර්දේශ කරන ලදී.

ඒ අනුව සුදුසු මෘදුකාංගයක් නිර්මාණය කරදීමට තොරතුරු තාක්ෂණ ශාඛාව වෙත පවරන ලදී. තොරතුරු තාක්ෂණ ශාඛාව මඟින් Sky Management Systems නමැති ආයතනය නොමිලේ මාර්ගගත වැඩසටහන සකස් කරදීම සඳහා හඳුන්වාදෙන ලදී.

ඒ අනුව එම ආයතනය මඟින් Online වැඩසටහන සකස් කරන ලදී .

ඒ අනුව මේ දක්වා ඉටුකර ඇති කාර්යයන් පහත පරිදි වේ.

| ඉටුකර ඇති කාර්යයන් | කාල වකවානුව |
|---|---|
| 01. හෝමාගම සහ ශ්‍රී ජයවර්ධනපුර යන කලාපයන්හි නියාමන වැඩසටහන ක්‍රියාත්මක කිරීම . එහිදී ශිෂ්‍යාධාර මාර්ගගත | සැප්තැම්බර් 2018 සිට අද දක්වා |

| | | |
|---|---|---|
| | වැඩසටහන මඟින් ගෙවීම් සිදුකිරීම. | |
| 02. | මෙම වැඩසටහන දීපව්‍යාප්තව ඉටුකිරීම සඳහා කලාප අධ්‍යාපන කාර්යාල වල විෂය සම්බන්ධීකරණ නිලධාරී සහ විෂය ලිපිකරු සම්පත්දායකයන් ලෙස පුහුණු කිරීම. | 2018සැප්තැම්බර් 2018 - නොවැම්බර් |
| 03. | එම සම්පත්දායකයින් විසින් ජාතික පාසල්වල විෂය භාර නියෝජ්‍ය විදුහල්පති සහ විෂය ලිපිකරු එම වැඩසටහන සඳහා පුහුණු කිරීම. | - ජනවාරි 2019 2019පෙබරවාරි |
| 04. | 5 ශ්‍රේණි ශිෂ්‍යාධාර ජාතික පාසල් සඳහා ගෙවීම සම්බන්ධයෙන් අදාළ චක්‍රලේඛය නිකුත් කිරීම | - 2019පෙබරවාරි |
| 05. | 5ශ්‍රේණි ශිෂ්‍යාධාර හිමි සියළු සිසුන්ගේ තොරතුරු ජාතික පාසල් විසින් ඇතුළත් කිරීම | 2019 පෙබරවාරි- අප්‍රේල් |
| 06. | 5ශ්‍රේණි ශිෂ්‍යාධාර මාර්ගගත වැඩසටහනෙහි දත්ත ඇතුළත් කිරීම සම්බන්ධ ප්‍රගති සමාලෝචන සිදුකිරීම. | 2019 මාර්තු - අප්‍රේල් |

**සැලසුම් කර ඇති ඉදිරි වැඩසටහන්**

| | කාර්යයන් | කාල වකවානුව |
|---|---|---|
| | මෙම මාර්ගගත වැඩසටහන නිල වශයෙන් දියත් කිරීම. | |
| 07. | 5 ශ්‍රේණි ශිෂ්‍යාධාර මාර්ගගත වැඩසටහනේ ගෙවීම් කලාප මට්ටමින් සිදු කිරීම. මෙහිදී අධ්‍යාපන අමාත්‍යාංශය මුදා හරින ප්‍රතිපාදන පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව හරහා කලාප අධ්‍යාපන කාර්යාලයට ලබාදෙනු ලබයි. ශිෂ්‍ය ගිණුම්වලට මුදල් බැර කිරීම සඳහා මෙම මාර්ගගත වැඩසටහනින් මාසිකව ස්වයංක්‍රීයව සකස්වන Slip file එක download කර කලාප අධ්‍යාපන කාර්යාලය විසින් චෙක්පත සමඟ අදාල බැංකුව වෙත යොමු කරනු ලබයි. | 2019 අප්‍රේල් සිට ඉදිරියට |
| 08. | ප්‍රගති සමාලෝචනය | මැයි සිට 2019 ඉදිරියට |
| 09. | පිරිවෙන් සහ පෞද්ගලික පාසල් මාර්ගගත වැඩසටහන සඳහා එක් කිරීම . | ජුනි සිට 2019 ඉදිරියට |

| | | | |
|---|---|---|---|
| | | 10. මාර්ගගත වැඩසටහනින් සියළු ජාතික පාසල් සඳහා ගෙවීම් සිදුකිරීම . ප්‍රගති සමාලෝචනය තුළින් නියාමන හා ගැටළුවලට විසඳුම් ලබාදීම. | ජනවාරි සිට 2019 ඉදිරියට |
| | | 11. පළාත් පාසල් සඳහා ශිෂ්‍යාධාර ගෙවීම මාර්ගගත වැඩසටහනින් සිදුකිරීම හා චක්‍රලේඛය නිකුත්කිරීම . | ජනවාරි සිට 2020 ඉදිරියට |
| 4. | **විදුහල්පතිවරු බඳවාගැනීම් පිළිබඳ වර්තමාන තත්ත්වය.**<br><br>ජාතික පාසැල් 248ක නීත්‍යානුකූලව විදුහල්පතිවරුන් පත්තකර නොතිබූ බවද මෙම පාසැල් සඳහා විදුහල්පතිවරුන් බඳවා ගැනීමේ නිවේදනය අධ්‍යාපන සේවා කොමිසමට බාර දී ඇති බවද ප්‍ර.ග.නි. පැවසීය.මෙම නිවේදනය මෙම මස අවසානයේ හෝ දෙසැම්බර් මස තුලදී ගැසට් කිරීමට නියමිත බවද ඔහු අනාවරණය කළේය. | ▪ දිවයිනේ ජාතික පාසල් 302 ක පවතින විදුහල්පති තනතුරු පුරපුපාඩු පිරවීම සඳහා සම්මුඛ පරික්ෂණය 2018 ඔක්තොම්බර් මස 16, 18, 19, 20, 22, 23, 25, 26, 27 යන දිනයන්හිදීත් නොවැම්බර් මස 26, 27, 29 යන දිනයන්හිදී සහ දෙසැම්බර් මස 01, 02, 03, 04, 06, 07, 14,17 දිනයන්හි පවත්වන ලද අතර එම පුරප්පාඩු වී ඇති විදුහල්පති තනතුරු සඳහා සම්මුඛ පරික්ෂණය අනුව යෝජිත නිලධාරීන්ගේ නාම ලේඛනය හා සම්මුඛ පරික්ෂණයට අදාල අනෙකුත් සියළුම ලේඛණ අංක ED/4/58/20/ESC(ii) හා 2019.02.13 දිනැති ලිපිය මඟින් රාජ්‍ය සේවා කොමිෂන් සභාවේ අධ්‍යාපන සේවා කමිටුව වෙත යොමු කරන ලදී.<br><br>▪ රාජ්‍ය සේවා කොමිෂන් සභාවේ අධ්‍යාපන සේවා කමිටුවේ ලේකම්ගේ අංක ESC/APP/SLPS/04/59/2017 (VOL II) හා 2019.03.01 දිනැති ලිපිය මඟින් පාසල් බොහොමයක් සඳහා නියමිත සේවයේ/ ශ්‍රේණියේ නිලධාරීන් ඉල්ලුම් කර නොතිබීම මත එම සම්මුඛ පරික්ෂණය හා සම්මුඛ පරික්ෂණ ලේඛණ අවලංගු කිරීමට තීරණය කර ඇත.<br><br>▪ මේ පිළිබඳව රාජ්‍ය සේවා කෙකම්ෂන් සභාවේ අධ්‍යාපන සේවා කමිටුව සමඟ තවදුරටත් සාකච්ඡා කරමින් පවතී. | |
| 5. | **2015 හා 2016 වර්ෂවල සමාන්තර පන්තිවල සීමාවන් ඉක්මවා සිසුන් ඇතුළත් කිරීම.**<br><br>1,5 හා 6 ශ්‍රේණිවලට හැර අතරමැද ශ්‍රේණිවලට සිසුන් ඇතුළත් කිරීමේදී 2008/37 චක්‍රලේඛයට අනුව ක්‍රියා කරන බව පැවසූ ප්‍ර.ග.නි. විශේෂ අවස්ථා වන අධිකරණ සේවයේ නිළධාරීන්, වෛද්‍යවරුන්, හදිසි ආපදා වලදී පදිංචිය වෙනස් වීම්, අධිවේගී මාර්ගයන් නිසා නිවාස අහිමිවීම් හා රජයේ සේවකයන්ගේ ස්ථාන මාරුවීම් සිදුවීමේදී මෙලෙස අමතර සිසුන් ඇතුලත් කිරීම සිදුවන බව ප්‍රකාශ කළේය. | ජාතික පාසල්වල අතරමැදි ශ්‍රේණි සඳහා සිසුන් ඇතුලත් කිරීමට අධ්‍යාපන අමාත්‍යාංශයේ ජාතික පාසල් ශාඛාවට තැපැල් මගින්ද, මහජනතාව පැමිණ කරන ඉල්ලීම්ද, ගරු මැති ඇමතිවරුන් විසින් යොමු කරන ලද ඉල්ලීම්ද දිනපතා අතිවිශාල සංඛ්‍යාවක් ලැබේ. එහිදී එම ඉල්ලීම් ජාතික පාසල්වල විදුහල්පතිවරුන් වෙත යොමු කොට 2008/37 චක්‍ර ලේඛ ප්‍රකාරව විදුහල්පති විසින් නිර්දේශ ලබාදෙන ලෙස දන්වා යැවීම සාමාන්‍ය ක්‍රමවේදයයි. ඒ අනුව පාසල්වල 1, 5, 6 හැර අතරමැදි ශ්‍රේණිවල පවතින පුරප්පාඩු අනුව 2008/37 චක්‍ර ලේඛ ප්‍රකාරව සකස්කරන ලද විදුහල්පති නිර්දේශිත නාම ලේඛන සඳහා අධ්‍යාපන ලේකම්ගේ අනුමැතිය ලබාගෙන එම අනුමත ලේඛන නැවත විදුහල්පතිවරුන්ට යවනු ලැබේ. ඉන්පසු ඇතුලත් කිරීම් කටයුතු කිරීම සාමාන්‍ය ක්‍රමවේදය වේ.<br><br>එහෙත් වාර්ෂික ස්ථාන මාරු ලබන විනිශ්චයකාරවරුන්ගේ දරුවන්, වෛද්‍යවරුන්ගේ දරුවන්, විශ්ව විද්‍යාල කථිකාචාර්යවරුන්ගේ දරුවන්, එකම පාසලේ සේවා කාලය වසර 03 සම්පූර්ණ කරන ලද අධ්‍යයන කාර්ය මණ්ඩල නිලධාරීන්ගේ | |

| | | |
|---|---|---|
| | | දරුවන්, අනධ්‍යයන කාර්ය මණ්ඩල නිලධාරීන්ගේ දරුවන් සේවා අවශ්‍යතාවය මත සලකා ඇතුලත් කිරීම් කටයුතු සිදුකරනු ලැබේ. |
| 6. | **ජාත්‍යන්තර පාසැල් අධීක්ෂණය හා නියාමනය සහ ජාත්‍යන්තර පාසැල්වලින් වර්ෂයේ අතරමැදදී රජයේ පාසැල්වලට සිසුන් ඇතුලත් කිරීමේ ක්‍රමවේදය සහ පවත්නා නීති රාමුව තුල එනම් 1961 අංක 08 දරන උපකෘත පාඨශාලා අභ්‍යාස විද්‍යාල (අතිරේක විධිවිධාන) පනතේ 25වන වගන්තිය අනුව මෙම පාසැල් ආරම්භ කළ නොහැකි වුවද දිවයින පුරා මෙම පාසැල් සීඝ්‍රයෙන් ව්‍යාප්ත වීම් පිළිබඳවත් ජාත්‍යන්තර පාසැල්වලින් රජයේ පාසැල්වලට මාරු වීමේදී එම පාසැල්වල වාර්ෂික අධ්‍යයන කාල සීමාවේ වෙනස්කම් නිසා නිසි වයස් සම්පූර්ණ නොවූ සිසුන් සාමාන්‍ය පෙළ හා උසස් පෙළ සඳහා ඉදිරිපත් වීම.**<br><br>මේ සඳහා 2008/37 චක්‍රලේඛය උපයෝගී කර ගන්නා බවද මේ තත්ත්වය වැලැක්වීම සඳහා රජයේ පාසැල් සඳහා නව චක්‍රලේඛයක් නිකුත් කිරීමට බලාපොරොත්තු වන බවද ප්‍ර.ග.නි. පැවසීය. | ජාතික අධ්‍යාපන ප්‍රතිපත්තියට අනුකූලව ජාත්‍යාන්තර පාසල් අධීක්ෂණය කිරීම අධ්‍යාපන අමාත්‍යාංශයේ අරමුණක් වේ. එහෙයින්, ජාත්‍යාන්තර පාසල් නියාමනයට ලක් කිරීමට හැකිවන පරිදි නීති සංශෝධනය කිරීම අත්‍යාවශ්‍ය කාරණයකි. ඒ සඳහා 1961 අංක 08 දරණ උපකෘත පාසල් හා අභ්‍යාස විද්‍යාල (අතිරේක විධිවිධාන) පනතේ 25 වගන්තිය සංශෝධනය කිරීම ( පෞද්ගලික පාර්ශවයන්ටද පාසල් ආරම්භ කිරීමට හැකිවන පරිදි) කල යුතු අතර, එය සමාජමය හා දේශපාලනමය වශයෙන් සංවේදී කාරණයක් වියහැකි වන හෙයින් මේ වන තුරු මෙම වගන්තිය සංශෝධනය වී නොමැත.<br><br>ජාතික ප්‍රතිපත්ති හා ආර්ථික කටයුතු අමාත්‍යාංශය විසින් අමාත්‍ය මණ්ඩල සංදේශයක් (අංක MNPEA/2018/064 හා 2018.04.09 දිනැති) ඉදිරිපත් කරන ලදී. ඊට අදාලව 2019.01.22 දින ලබාදී ඇති අමාත්‍ය මණ්ඩල තීරණයේ (අංක 19/0132/105/003 හා 2019.01.30 දිනැති) සඳහන් කර ඇත්තේ ජාතික ප්‍රතිපත්ති හා ආර්ථික කටයුතු අමාත්‍යාංශ ලේකම්, අධ්‍යාපන අමාත්‍යාංශයේ ලේකම් හා එක්ව ජාත්‍යාන්තර පාසල්වල තත්ව සහතික කිරීම සහ අධීක්ෂණය කිරීම පිළිබඳ ප්‍රතිපත්තියක් ජාතික අධ්‍යාපන කොමිෂන් සභාව ලවා කඩිනමින් කෙටුම්පත් කරවා ගැනීමට අවශ්‍ය පියවර ගන්නා ලෙසත්, එම කෙටුම්පත් ප්‍රතිපත්තිය සලකා බැලීම පිණිස ජාතික ප්‍රතිපත්ති, ආර්ථික කටයුතු අමාත්‍යතුමා හා අධ්‍යාපන අමාත්‍යතුමා මඟින් අමාත්‍ය මණ්ඩලය වෙත ඉදිරිපත් කරන ලෙසත්ය. ජාතික අධ්‍යාපන කොමිෂන් සභාව විසින් ජාත්‍යන්තර පාසල් සම්බන්ධ ඉහත ප්‍රතිපත්තිය කෙටුම්පත් කර, අමාත්‍ය මණ්ඩලය වෙත ඉදිරිපත් කර අනුමැතිය ලැබීමෙන් පසු ජාත්‍යන්තර පාසල් සම්බන්ධව අධ්‍යාපන අමාත්‍යාංශයට කටයුතු කිරීමේ හැකියාව ලැබෙනු ඇතැයි අපේක්ෂා කෙරේ.<br><br>එසේම ජාත්‍යන්තර පාසල්වල සිසුන් අතරමැදි පන්ති සඳහා රජයේ පාසල්වලට ඇතුලත් වීමේදී වයස් මට්ටම හා සාධන මට්ටම පිළිබඳව විශේෂ අවධානය යොමු කරනු ලබයි. එබැවින් අ.පො.ස.(සා.පෙළ) හා අ.පො.ස. (උ.පෙළ) විභාග සඳහා පාසල් අයදුම්කරුවන් ලෙස පෙනී සිටීමේදී වයස් සීමාවේ විශේෂ වරප්‍රසාදයක් ඔවුන් හිමි නොවේ. එම නිසා රජයේ පාසල් වල එම වයස් සීමාවේ පසුවන සිසුන්ට ජාත්‍යාන්තර පාසල් වලින් පැමිණි සිසුන් නිසා, වයස් සීමාව මුල් කරගෙන අසාධාරණයක් සිදු නොවේ. |
| 7. | **යුනෙස්කෝ මූලස්ථානය විසින් 2014-2015 කාලය තුල අනුමත කරන ලද ශ්‍රී ලංකාවේ විදුහල්පති භූමිකාව පිළිබඳ අධ්‍යනය කර අත්පොතක් සම්පාදනය කර 2016 ජූලි 31 දිනට පෙර භාර දීම සඳහා වූ ව්‍යාපෘතිය හා මධ්‍යම පරිසර අධිකාරිය මඟින් ක්‍රියත්මක කිරිමට නියමිතව තිබුණු කාබන් අපද්‍රව්‍ය පරිසරයට මුදා හැරීමෙන් සිදුවන හානිය අවම කිරීම සඳහා වන ව්‍යාපෘතිය සඳහා 2015/07/20 දින ප්‍රදානය කළ රු. 8,269,557 න් (එ.ජ.ඩොලර් 61,945 න්) 87.45%ක් අපේක්ෂිත පරිදි ව්‍යාපෘතිය ක්‍රියාත්මක නොකිරීම නිසා ආපසු යවා තිබීම.**<br><br>අදාළ ව්‍යපෘති සඳහා ප්‍රතිපාදන ලැබීමේ ප්‍රමාදය | යුනෙස්කෝ ද්වි වාර්ෂික සහභාගීත්ව වැඩසටහන යටතේ ශ්‍රී ලංකාව විසින් ව්‍යාපෘති යෝජනා ඉදිරිපත් කරන අතර ඉන් අනුමත වන ව්‍යාපෘති යෝජනා ක්‍රියාත්මක කිරීම සඳහා යුනෙස්කෝ මූලස්ථානය වෙතින් මූල්‍ය ප්‍රතිපාදන සළසනු ලබන අතර නියමිත කාලය තුළ ව්‍යාපෘති නිම කොට නියමිත දිනට මුදල් පියවීම් සිදු කළ යුතුව ඇත.<br><br>එහිදී අප රට විසින් ඉදිරිපත් කරනු ලබන ව්‍යාපෘති යෝජනා යුනෙස්කෝ මූලස්ථානය වෙත ඉදිරිපත් කිරීම, ව්‍යාපෘති අනුමත වීමෙන් පසුව එම ව්‍යාපෘති ක්‍රියාත්මක කරනු ලබන ආයතන සහ යුනෙස්කෝ මූලස්ථානය සම්බන්ධීකරණය කිරීම සහ ව්‍යාපෘති වල මූල්‍ය / භෞතික ප්‍රගතිය පසු විපරම් කිරීම මෙම කොමිෂන් සභාවේ කාර්යභාරය වේ. |

| | | |
|---|---|---|
| | මෙම ව්‍යාපෘති ක්‍රියාත්මක නොකිරීමට හේතුවූ බව ප්‍ර.ග.නි./ ග.නි. පැවසීය. | ඒ අනුව 2014-2015 ද්වි වර්ෂය සඳහා අනුමත වූ ව්‍යාපෘති සඳහා අප වෙත ලැබුණු මූල්‍ය ප්‍රතිපාදන අදාළ ව්‍යාපෘති ඉදිරිපත් කරනු ලබන ආයතන වෙත නිදහස් කළ අතර අදාළ සම්බන්ධීකරණ කටයුතු සිදු කරන ලදී.<br><br>මෙහිදී යුනෙස්කෝ මූලස්ථානය වෙත ව්‍යාපෘති යෝජනා ඉදිරිපත් කිරීමෙන් අනතුරුව ප්‍රමාණවත් කාලයක් මේ සඳහා මිඩංගු කොට සුදුසු ව්‍යාපෘති පමණක් අනුමත කිරීමෙන් පසුව අදාළ මූල්‍ය ප්‍රතිපාදන අප වෙත ලබා දීමටද සෑහෙන කාලයක් ගතවෙනු ඇත. මෙලෙස ප්‍රමාද වී ලැබුණු මූල්‍ය ප්‍රතිපාදන 2014-2015 ද්වි වාර්ෂික ව්‍යාපෘති යෝජනා යටතේ අනුමත වූ ව්‍යාපෘති දෙකක්, එම ව්‍යාපෘති ඉදිරිපත් කරන ලද ආයතන විසින් ක්‍රියාත්මක කිරීම සඳහා උත්සහ කළද අදාළ මූල්‍ය වර්ෂය තුළදී එය මුලුමනින්ම සම්පූර්ණ කිරීමට අපොහසත් වී ඇත.<br><br>මෙම සිදුවීමෙන් පසු ඉදිරියේදී අනුමත වන ව්‍යාපෘති සම්බන්ධයෙන් අදාළ මූල්‍ය වර්ෂය තුළදී ව්‍යාපෘති ක්‍රියාත්මක කිරීම සම්බන්ධයෙන් පසු විපරම් කිරීමක් සහ කාලීනව වාර්තා ලබා ගැනීම සඳහා කටයුතු කරනු ඇත. |
| 8. | **2001 වර්ෂයේ දී පිහිට වූ සිසු අරුණ අධ්‍යාපනික (විශේෂ ශිෂ්‍යත්ව) අරමුදලේ ස්ථාවර තැන්පතු ගිණුමේ රු. 3,584,879 ක ශේෂයක් හා ජංගම ගිණුමේ රු. 159,530ක ශේෂයක් පැවතුණ මුත් වසර 16 ක් ගතවී තිබුණ ද අරමුණුගත පරිදි ශිෂ්‍යත්ව ලබා දීමට 2017/10/30 දින දක්වාත් අපොහොසත් වී තිබීම.**<br><br>මෙම අරමුදල නැවත සක්‍රිය කිරීමට මාස 2 ක් තුල ක්‍රියා කරන බව මෙහිදී ප්‍ර.ග.නි. සහතික විය. | සිසු අරුණ ගැරන්ටි ලිමිටඩ් නැමැති සමාගම් නාමය යටතේ එම අරමුදල ස්ථාපිත කර ඇති අතර එම සමාගම් නාමය කපාහැර ඇති බැවින් ඊට අදාල දේපළ හා අයිතිවාසිකම් මහා භාණ්ඩාගාරය වෙත පැවරී ඇත.<br><br>ඒ පිළිබඳව නීතිපති දෙපාර්තමේන්තුව විමසීමේදී අදාල අධිකාරීන් සමඟ කටයුතු කර උක්ත සමාගම නැවත පිහිටුවීම හෝ අදාල විෂය පථයට මුදල් නිදහස් කිරීම සම්බන්ධයෙන් භාණ්ඩාගාර ලේකම් විමසන ලෙස උපදෙස් ලබාදී ඇත. ඒ සඳහා කරන ලද විමසීම් අනුව රාජ්‍ය මුදල් දෙපාර්තමේන්තුව මඟින් අදාල කාර්යයන් තවදුරටත් කරගෙන යාමේ අවශ්‍යතාවය මත එම කාර්යයන් සඳහා වෙනම අයවැය ප්‍රතිපාදන වෙන් කරවා ගෙන ජාතික අයවැය තුල තවදුරටත් ඉදිරියට කරගෙන යාම සුදුසු බව නිරීක්ෂණ ලබාදී ඇත.<br><br>ඒ අනුව මෙම අරමුදලෙහි අඛණ්ඩව වැඩසටහනක් ක්‍රියාත්මක කර ගෙන යාම සඳහා ප්‍රමාණවත් මුදලක් නොමැති බැවින් භාණ්ඩාගාර ලේකම් වෙත මෙම අරමුදල මහා භාණ්ඩාගාරයේ ඒකාබද්ධ අරමුදලට බැර කර මෙම අමාත්‍යාංශය මඟින් ක්‍රියාත්මක කරනු ලබන වෙනත් ශිෂ්‍යාධාර වැඩසටහනක් සඳහා මුදල් නිදහස් කරන ලෙස ED/01/12/14/05/01 හා 2019.03.13 දිනැති ලිපියෙන් භාණ්ඩාගාරයෙන් ඉල්ලීමක් ඉදිරිපත් කර ඇත. |
| 9. | **2016 වර්ෂයේ දී ලබාගත් නියැදියක් මඟින් ශ්‍රී ලංකා විදුහල්පති සේවයේ නිලධාරීන්ගේ විශ්‍රාම ගැන්වීමේ ලිපිගොනු ප්‍රමාද වී යැවීම නිසා විශ්‍රාම ගැන්වීම නියමිත දිනට සිදු නොවීම ද විශ්‍රාම යන ගුරු භවතුන්ගේ වැටුප් වර්ධක හා වැටුප් සංශෝධන සිදු කිරීමට දිගු කාලයක් ගතවීම.**<br><br>මේ පිළිබඳ විශේෂ වැඩපිළිවෙලක් සකස් කරගෙන යන බව පැවසූ ප්‍ර.ග.නි. ඒ සම්බන්ධයෙන් කාරක සභාවට හැකි ඉක්මනින් වාර්තා කරන බවට සඳහන් කළේය. විශ්‍රාම ගැනීමට අවුරුදු 5කටවත් පෙර ලිපි ගොනුව | ▪ ශ්‍රී ලංකා විදුහල්පති සේවයේ නිලධාරීන් විශ්‍රාම ගැන්වීම නියමිත දිනට සිදු කිරීමේ අරමුණින් නිලධාරීන් අනිවාර්ය විශ්‍රාම ගැනීමේ දිනට මාස 06 කට පෙර විශ්‍රාම ගැන්වීමට අදාල ලිපි ලේඛන විදිමත්ව ගෙන්වා ගැනීම සඳහා අදාල නිලධාරියා සහ කලාපය දැනුවත් කිරීමේ වැඩපිළිවෙලක් විදුහල්පති ශාඛාව මඟින් මේ වනවිට සිදු කෙරෙමින් පවතී.<br><br>▪ ඒ අනුව, ශ්‍රී ලංකා විදුහල්පති සේවයේ නිලධාරීන් විශ්‍රාම ගැන්වීමට අදාලව පහත පරිදි කටයුතු සිදු කර ඇත. |

| | | |
|---|---|---|
| | යාවත්කාලීන කළ යුතු බව කාරක සභාව අවධාරණය කළේය. | 2018 වර්ෂය සඳහා පෙර දැනුම්දීම් - 451<br>2019 වර්ෂය සඳහා පෙර දැනුම්දීම් - 325<br>(2019. 03.27 දිනට)<br><br>▪ 2018 වර්ෂය තුල විශ්‍රාම ගන්වනු ලැබූ (2019 වසරේ මුල් මාස කීපය තුල විශ්‍රාම යාමට නියමිත නිලදාරීන් කොටසක්ද සමඟ) ශ්‍රී ලංකා විදුහල්පති සේවයේ මුළු නිලධාරීන් සංඛ්‍යාව 550කි.<br><br>▪ තවද, අනිවාර්ය විශ්‍රාම ගැනීමේ සිට වසර 05 කට පෙර නිලධාරීන්ගේ පෞද්ගලික ලිපි ගොනුව යාවත් කාලීන කරන ලෙසට කළාප අධ්‍යාපන අධ්‍යක්ෂකවරුන් දැනුවත් කිරීම 2019.05.30 දිනට පෙර අවසන් කිරීමට කටයුතු කර ඇත.<br><br>▪ එසේම, ඉදිරියේදී ඇතිවිය හැකි ප්‍රමාදයන් වලක්වා ගැනීම සඳහා 2016 වසරේ ශ්‍රී ලංකා විදුහල්පති සේවයේ III පන්තියට බඳවා ගත් නවක විදුහල්පතිවරුන්ගේ සේවය ස්ථිර කිරීමේ කටයුතු මේ වන විට සිදු කරමින් පවතින අතර ඉදිරි වසර තුල එම කාර්යයන් නිම කිරීමට අපේක්ෂා කෙරේ. |
| 10. | **2016 වර්ෂයේ දී වවුචර්පත් ක්‍රමයට මාරු වී පාසැල් නිල ඇඳුම් බෙදාදීමේ ක්‍රියාවලිය ආරම්භ වූ අතර ඒ වනවිට 12/31/2016 දිනට රු. 675,296,036ක් වටිනා පාසැල් හා පිරිවෙන් නිල ඇඳුම් හා සිවුරු රෙදි පැකට 2,683,716 ක් ඉතිරි වී තිබීම.**<br><br>මෙම තොගය උසස් තත්ත්වයේ පවතින ස්වාරක්ෂක තොගයක් (Buffer Stock) බවද දැනට මෙය ගංවතුර ආධාර ලෙස බෙදා දී ඇති බවද ප්‍ර.ග.නි. පැවසීය. | රජයේ ප්‍රතිපත්තිමය තීරණ මත 2016 වර්ෂයේදී නිල ඇඳුම් තිළිණපත් ලබාදීම ආරම්භ කල අතර, පැවති අමාත්‍ය මණ්ඩල තීරණ ප්‍රකාරව ආරක්ෂිත තොගයක් රඳවා ගෙන ගබඩා කර තබා ගැනීම අනිවාර්යය විය. එසේ මිළදී ගෙන ගබඩා කර තිබූ ආරක්ෂිත තොගය නිලඇඳුම් ගබඩාවේ තිබූ අතර එම ප්‍රමාණය හදිසියේ ගංවතුරෙන් පීඩාවට පත් සිසුන් සඳහා ලබාදී මේ වන විට සියලු නිල ඇඳුම් රෙදි තොගය බෙදා අවසන් කර ඇත. |
| 11. | **1980/10/01 දිනැති අංක 108/6 දරන ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ අති විශේෂ ගැසට් පත්‍රය උල්ලංඝණය කරමින් පිරිවෙන් වැඩි ප්‍රමාණයක් කටයුතු කරමින් පැවති අතර වාර්ෂිකව රු. මිලියන 300ක පමණ මුදලක් වෙන් කරනු ලබන මෙම පිරිවෙන් අධීක්ෂණය සහ නියාමනයට ප්‍රමාණවත් වැඩ පිළිවෙලක් ද ක්‍රියාත්මක නොපැවතීම.**<br><br>2014/2015වර්ෂ වලදී පිරිවෙන් අධ්‍යක්ෂකවරයෙක් නොසිටීම මෙම තත්ත්වයට හේතුවූ බවත් 2016/2017 වර්ෂ වලදී පිරිවෙන් නියාමනය ක්‍රමානුකූලව සිදුකර ඇති බවත් කාරක සභාවේ හමුවේ අනාවරණය විය. කෙසේ නමුත් පිරිවෙන් හි ශිෂ්‍ය අනුපාතය අනුව ගුරුවරු අනුයුක්ත කිරීමේ පදනම ද වෙනස් විය යුතු බවද විෂයානුකූල පදනම ද මේ සඳහා ඉවහල් කර ගත යුතු බවද ඉංග්‍රීසි මාධ්‍ය පිරිවෙන්හි පෙළපොත් හා ප්‍රශ්න පත්‍ර ලබා ගැනීමේ ප්‍රශ්නයක් ඇති බවද හෙළි විය. | පිරිවෙන් අධීක්ෂණ හා නියාමන නිලධාරීන් වැඩිකර ඇත. සහකාර අධ්‍යාපන අධ්‍යක්ෂ හිමිවරු 18ක්, විෂය අධ්‍යක්ෂවරු 12ක්, පිරිවෙන් සම්බන්ධීකරණ නිලධාරීන් 30 ක් හා ගුරු උපදේශකවරු 190ක් මේ වන විට සේවයේ නිරතව සිටී. කාර්යාල කටයුතු හා විෂය අධීක්ෂණය කරනු ලබයි. වර්තමානයේ පිරිවෙන් නියාමනය සතුටුදායකයි.<br><br>වර්තමානය වන විට පිරිවෙන් ශාඛාවේ අධ්‍යක්ෂවරයෙකු සිටින අතර ගුරු-ශිෂ්‍ය තුලනය කර පිරිවෙන්වලට අවශ්‍ය වන ප්‍රමාණයට ගුරුවරු ලබා දී ඇත. විෂයානුබද්ධව ගුරුපත්වීම් ලබාදී ඇත්තේ පුරප්පාඩු විෂයයන් සඳහා පමණි.<br>ඉංග්‍රීසි මාධ්‍ය පිරිවෙන් සඳහා විෂය නිර්දේශය පරිවර්තනය කර ඇත. ඉංග්‍රීසි භාෂා අංශය සමග සම්බන්ධ වී පිරිවෙන් පෙළපොත් ඉංග්‍රීසි භාෂාවට පරිවර්තනය කිරීමට කටයුතු කරමින් පවතින අතර ප්‍රශ්න පත්‍ර විභාග දෙපාර්තමේන්තුවෙන් ඉංග්‍රීසි මාධ්‍ය පිරිවෙන් සඳහා පරිවර්තනය කර ලබාදෙනු ලබයි.<br><br>පිරිවෙන් පරිහානිය සම්බන්ධයෙන් ඒ ඒ ආයතනවල කෘත්‍යාධිකාරී ස්වාමීන් වහන්සේලා හා පරිවෙණාධිපති ස්වාමීන් |

| | | |
|---|---|---|
| | පිරිවෙන් නියාමනය ක්‍රමානුකූල කර පිරිවෙන් අධ්‍යාපනය පිරිහීමට බලපා ඇති කරුණු අවම කර ඒ පිළිබඳ වාර්තාවක් ලබා දෙන ලෙස කාරක සභාව නියෝග කළේය. | වහන්සේලා පෞද්ගලිකව වගකිව යුතු බව පෙනෙයි. අධ්‍යාපන අමාත්‍යාංශය හා එහි පිරිවෙන් අධ්‍යාපන ශාඛාවේ කාර්යය වනුයේ අධ්‍යාපනික කටයුතු වර්ධනය කිරීම සඳහා උපකාරී වීම හා සහය වීමයි. ඊට අදාළ සියලු කටයුතු අධ්‍යාපන අමාත්‍යාංශයේ පිරිවෙන් අධ්‍යාපන ශාඛාවෙන් නොඅඩුව ඉටු කරනු ලැබේ. |
| 12. | **2016 පෙබරවාරි 12 දින සිදු කරන ලද නියෝගය පරිදි පාසැල් සිසුන්ගේ හා ගුරුවරුන්ගේ තොරතුරු ඇතුළත් ක්‍රමවත් පරිගණක වැඩපිළිවෙලක් සකස් කරන ලෙස කරන ලද නියෝගය තවමත් ක්‍රියාත්මක නොකිරීම.**<br><br>ශ්‍රී ලංකා ටෙලිකොම් සමාගම වෙත මේ සඳහා රු. මිලියන 10.5කට ආසන්න පිරිවැයක් දැරීමට සිදු වී ඇති නමුත් පිරිවැයට ගැලපෙන ධාරිතාවක් හා වේගයක් නොමැති බැවින් 2017.02.28 දින සම්බන්ධතාවය විසන්ධි කර ඇති බව අනාවරණය විය. එසේම පාසැල් පරිගණක ජාලය ක්‍රියාත්මක නොවීම නිසා 2013.12.31 වන විට රු. 16,122,312 ක් වැයකර ස්ථාපිත කර තිබූ අධ්‍යාපනික කළමනාකරණ තොරතුරු පද්ධතිය ද අකර්මන්‍ය වී ඇති බව හෙළිවිය. මේ වන විට නැවතත් මෙම වැඩසටහන ක්‍රියාත්මක අදියරේ පවතින බවද බාහිරකරණය (Outsource) මඟින් වැඩසටහන ක්‍රියාත්මක කරන බවද ප්‍ර.ග.නි. පැවසීය. මෙහි ඇති වැදගත්කම අවධාරණය කළ කාරක සභාව මෙය ක්‍රියාත්මක වන ආකාරය පිළිබඳ දින වකවානු සහිත වාර්තාවක් මසක් ඇතුලත ලබා දෙන ලෙස නියෝග කළේය. එමෙන්ම, අමාත්‍යාංශයේ තොරතුරු තාක්ෂණ අංශය සවිබල ගන්වන ලෙස කාරක සභාව නියෝග කළේය. | 1. පාසල් සඳහා අන්තර්ජාල පහසුකම් ලබාදීම සඳහා වූ පාසල්ජාල (Schoolnet) වැඩසටහන, 2005-12-30 දින සිට ආසියානු සංවර්ධන බැංකු ආධාර මත ක්‍රියාත්මක වූ ද්වීතියික අධ්‍යාපන නවීකරණ ව්‍යාපෘතිය මඟින් ආරම්භ කරන ලදී. ඒ අනුව අන්තර්ජාල පහසුකම් ලබාදීම සඳහා ශ්‍රී ලංකා ටෙලිකොම් සහ ඩයලොග් සමාගම වෙත පවරා තිබුණි. එමඟින් අධ්‍යාපන අමාත්‍යංශය, ජාතික අධ්‍යාපන ආයතනය, පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තු, කලාප අධ්‍යාපන කාර්යාල, ජාතික අධ්‍යාපන විද්‍යාපීඨ සහ පාසල් අන්තර්ගත වන පරිදි ආයතන 1750 ක් සඳහා අන්තර්ජාල පහසුකම් ලබාදීම සිදුකරන ලදී.<br><br>2. හිඟ බිල්පත් සඳහා මුදල් නොගෙවීමේ හේතුව මත 2016-02-17 දින ශ්‍රී ලංකා ටෙලිකොම් සමාගම විසින් ඔවුන්ගේ සේවාව අත් හිටුවන ලදී. කෙසේවුවද ගෙවීමට ඇති හිඟ මුදලින් 25% කට සරිලන මුදලක් අත්තිකාරම් වශයෙන් ගෙවීමෙන් අනතුරුව නැවත සම්බන්ධතාවය පිහිටුවන ලදී. බිල්පත් නොගෙවීමට හේතුව වූයේ ටෙලිකොම් ආයතනය විසින් ඒ වනවිට ලබා දී තිබු තඹ කම්බි (Copper line) සබඳතාවන් වෙනුවට ෆයිබර් (Fiber optic line) සම්බන්ධතා ස්ථාපනය කිරීමත් ඒ හේතුවෙන් වෙනස්වූ IP ලිපිනයන් ලබා දීම ප්‍රමාද වීමත්ය. බිල්පත් ගෙවීමේදී අදාළ කාලය තුල එම සබඳතා ක්‍රියත්මක තත්වයේ පැවතුනේද නැද්ද යන්න නිර්දේශයක් අධ්‍යාපන අමාත්‍යංශය විසින් මොරටුව විශ්වවිද්‍යාලයේ පැවති ජාල මෙහෙයුම් ඒකකයෙන් (Network Operation Unit) ලබාගැනීම සිදුකල අතර, එම නිර්දේශය ලබා දීමට IP ලිපිනයන් අවශ්‍ය විය.<br><br>3. කෙසේවුවද, මෙම අන්තර්ජාල පහසුකම් භාවිත කරන්නන් විසින් තම සබඳතාවයේ වේගය සහ ධාරිතාවය ප්‍රමාණවත් නොවන බව දැනුම් දීම මත 28-02-2017 දින පාසල් ජාලය (School net) සම්පූර්ණයෙන්ම නවත්වන ලදී.<br><br>4. ආසියානු සංවර්ධන බැංකු ආධාර මත ක්‍රියාත්මක වූ ද්වීතියික අධ්‍යාපන නවීකරණ ව්‍යාපෘතිය විසින් 2012 පෙබරවාරි 27 දින අධ්‍යාපන කළමනාකරණ තොරතුරු පද්ධතිය යටතේ වන ගුරුභවතුන්ගේ මානව සම්පත් කළමනාකරණ මාර්ගගත පද්ධතිය නිර්මාණය කිරීම සඳහා මොරටුව විශ්වවිද්‍යාලය වෙත පවරා තිබුණි. එම පද්ධතිය 2016 වර්ෂයේ අග භාගය වන තෙක් නිල වශයෙන් භාවිත කිරීම සඳහා යොදාගැනීමට අධ්‍යාපන පද්ධතියේ පැවති විවිධ පහසුකම්හි අඩුපාඩු හේතුවෙන් නොහැකිව තිබුණි.<br><br>5. දත්ත වල නිරවද්‍යතාවය උදෙසා, ගුරුභවතුන්ගේ පෞද්ගලික ලිපිගොනුව මත පදනම් ව ඒ ඒ පෞද්ගලික ලිපිගොනු භාරව කටයුතු කරන නිලධාරීන් විසින් දත්ත ඇතුලත් කිරීමේ කාර්යය සිදුකරනු ලබන බැවින් ඔවුන් වෙනත් ප්‍රමුඛතා කාර්යයන් එනම් වැටුප් පරිවර්තන, විදේශ නිවාඩු සකස් කිරීම වැනි කාර්යයන් සඳහා යෙදවීම මත යම් |

| | | |
|---|---|---|
| | | ප්‍රමාද වීම් සිදුවිය.<br><br>6. ගුරුභවතුන්ගේ මානව සම්පත් කළමනාකරණ මාර්ගගත පද්ධතියේ ක්‍රියාකාරිත්වය සඳහා අන්තර්ජාල පහසුකම් වල අවහිරතා සැලකිවයුතු බාධකයක් ලෙස ආරම්භයේදී බලපෑවද, එයට පිලියමක් වශයෙන් තොරතුරු හා සංනිවේදන තාක්ෂණ නියෝජිතායතනය (Information and Communication Technology Agency - ICTA) විසින් රජයේ ආයතන සඳහා ස්ථාපිත කරනු ලබන ලංකා රාජ්‍ය ජාලය (Lanka Government Network - LGN) යටතේ සියළුම කලාප අධ්‍යාපන කාර්යාල සඳහා නොමිලේ එම අන්තර්ජාල පහසුකම් ලබා ගැනීමට කටයුතු කරන ලදී. ප්‍රායෝගික හේතුන් මත එම සේවාව ලබාගත නොහැකි වූ ඉතාම අතලොස්සක් වූ කලාප කාර්යාල කිහිපයක් සඳහා broad band සබඳතා ලබා ගැනීමට කටයුතු කරන ලදී.<br><br>7. කෙසේවුවද මෙම සියළු ගැටළු මධ්‍යයේ මේ වනවිට ගුරුභවතුන්ගේ මානව සම්පත් කළමනාකරණ මාර්ගගත පද්ධතිය තුලට සියළුම රජයේ පාසල් සහ පිරිවෙන් හි ගුරුවරුන් ඇතුලත් කර අවසන් වී ඇත.<br><br>8. මේ වනවිට පළාත් මට්ටමින් අවසන් දත්ත පිරිසිදු කිරීමේ ක්‍රියාවලිය දත්ත කළමනාකරණ ශාඛාව විසින් සිදු කරමින් පවතී. මෙම ක්‍රියාවලියෙන් පසු පද්ධතිය භාවිතය සඳහා සුදුසු තත්වයකට පත්වේ. අප්‍රේල් මස 30 දිනට හෝ ඊට පෙර එම කටයුතු අවසන් කිරීමට සැලසුම් කර ඇත.<br><br>9. මෙම මාර්ගගත පද්ධතිය යාවත්කාලීන කිරීම සඳහා කලාප අධ්‍යාපන කාර්යාලයන්හි ආයතන අංශ වෙත පරිගණක සහ උපාංග පහසුකම් ලබාදීමට අවශ්‍ය කටයුතු අධ්‍යාපන අමාත්‍යංශය විසින් මේ වන විටත් සිදු කරමින් පවතී.<br><br>10. මීට අමතරව, ශිෂ්‍ය තොරතුරු පද්ධතිය මේ වනවිට නිර්මාණය කර අවසන් වී ඇති අතර මේ දිනවල 2019 වර්ෂය සඳහා රජයේ පාසල් වෙත පළමුවැනි ශ්‍රේණියට ඇතුලත් කරගන්නා ලද සිසුන්ගේ තොරතුරු ඇතුලත් කරමින් පවතී. සියළුම සිසුන්ගේ (13 ශ්‍රේණිය දක්වා) තොරතුරු ඇතුලත් කර අවසන් කිරීම දෙවන පාසල් වාරය අවසන් වන විට නිමකිරීමට සැලසුම්කර ඇත. |
| 13. | **රජයේ පාසැල් උසස් පෙළ සිසුන්ගේ පැමිණීමේ ප්‍රතිශතය අවම මට්ටමක පැවතීම**<br><br>මේ සම්බන්ධයෙන් පර්යේෂණයක් සිදුකර ඊට අවශ්‍ය කරන විසඳුම් සෙවිය යුතු බව අවධාරණය කළ කාරක සභාව ඒ සඳහා යෝජනා ඇතුළත් සම්පූර්ණ වර්තාවක් දෙසැම්බර් 01ට පෙර ලබා දෙන ලෙස නියෝග කළේය. | ජාතික අධ්‍යාපන ආයතනයේ පර්යේෂණ හා සංවර්ධන දෙපාර්තමේන්තුව මගින් මේ සම්බන්ධව පර්යේෂණයක් සිදු කර ඇත. එම පර්යේෂණයේ නිගමන, යෝජනා හා නිර්දේශ ඇමුණුම 2 මගින් ඉදිරිපත් කර ඇත. එම අදාළ නිර්දේශ ක්‍රියාත්මක කිරීම සඳහා අවශ්‍ය මූලික කටයුතු සම්පාදනය කරමින් පවතී. |

<table>
<tr>
<td>14<br>.</td>
<td>2017 අයවැය යෝජනාවක් පරිදි උසස් පෙළ ගුරුභවතුන් හා සිසුන් වෙනුවෙන් ටැබ් පරිගණක ලබා දීමේ දී ප්‍රසම්පාදනයේ දී ටැබ් පරිගණකවල තිබිය යුතු ධාරිතාවය හා ඒවායේ අඩංගු විය යුතු විෂය කරුණු පිළිබඳව හඳුනාගැනීම සඳහා ශක්‍යතා අධ්‍යනයක් සිදුකර නොතිබීම හා ප්‍රසම්පාදනයට අදාළ ගොනු හා තොරතුරු විගණනය වෙත ඉදිරිපත් නොකිරීම හේතුවෙන් එහි වර්තමාන තත්ත්වය පරීක්ෂා කිරීමට නොහැකි වීම.<br><br>ටැබ් පරිගණකවල අඩංගු වන විෂය කරුණු හඳුනාගැනීමට ශක්‍යතා අධ්‍යයනය ටැබ් ඒකක ප්‍රසම්පාදනයෙන් පසු සිදුකළ යුතු බව හා මෙම ටැබ් 2018 මාර්තු වන විට ලබා දීමට හැකියාවක් ඇති බව ප්‍ර.ග.නි. පැවසීය.</td>
<td>ටැබ් පරිගණක සඳහා ප්‍රසම්පාදන කමිටු අනුමැතිය මත ලංසුකරුවෙකු තෝරාගෙන, එම ලංසුකරු වෙත ලංසු ප්‍රදානය කිරිම පිළිබඳ විරෝධතා ඇත්නම් ඉදිරිපත් කරන ලෙස අනෙකුත් ලංසුකරුවන්ට දන්වන ලදී.<br><br>ඒ පිළිබඳව ලද අභියාචනා සලකා බැලූ ප්‍රසම්පාදන අභියාචනා මණ්ඩලය, අමාත්‍යාංශ ප්‍රසම්පාදන කමිටුව විසින් තෝරාගෙන තිබූ ලංසුකරු ප්‍රතික්ෂේප කරන ලද අතර, අනිකුත් ලංසුකරුවන් ලංසු වටිනාකම මත පෙල ගස්වා නිර්දේශ ඉදිරිපත් කර තිබිණි.<br><br>ඒ අනුව ළමුන්ගේ සෞඛ්‍ය ආරක්ෂිත බව හා කල්පැවැත්ම තහවුරු කෙරෙනෙ ආකාරයට එම ලංසු ප්‍රදානය කළයුතු බවට කරුණු දක්වමින් අමාත්‍ය මණ්ඩල සංදේශයක් ඉදිරිපත් කරන ලදී.<br><br>ඒ පිළිබඳව අමාත්‍ය මණ්ඩලය ලබාදුන් තීරණය ප්‍රකාරව, නැවත ලංසු තාක්ෂණික ඇගයීමට භාජනය කර, ලංසුකරු තෝරා ගෙන අමාත්‍ය මණ්ඩලය වෙත සංදේශයක් ඉදිරිපත් කරන ලදී.<br><br>එම අමාත්‍ය මණ්ඩල සංදේශය පිළිබඳව අතිගරු ජනාධිපතිතුමා විසින් නිරීක්ෂණ ඉදිරිපත් කරමින්, නියමු ව්‍යාපෘතියක් ලෙස ටැබ් පරිගණක මිලදී ගැනීමේ කාර්යය ක්‍රියාත්මක කරන ලෙස දන්වා තිබූ අතර, ඒ පිළිබඳව අමාත්‍ය මණ්ඩල අනු කමිටුවක් මඟින් නිර්දේශයන් ලබා ගෙන ඒ අනුව ව්‍යාපෘතිය ක්‍රියාත්මක කරන ලෙසද වැඩිදුරටත් දන්වා තිබිණි.<br><br>ඒ සඳහා පත් කරන ලද අමාත්‍ය අනු කමිටුව විසින්, සිය වාර්තාව 2019.03.29 දින ඉදිරිපත් කර ඇති අතර, ඊට අදාලව අමාත්‍ය මණ්ඩල සංදේශයක් ඉදිරිපත් කරන ලදී. එහි තීරණය අනුව ඉදිරි කටයුතු සිදුකරනු ලැබේ.</td>
</tr>
<tr>
<td>15<br>.</td>
<td>හත වසර භූගෝලය පෙළපොත සාමාන්‍ය කඩදාසියේ මුද්‍රණය කිරීමේ දී වැය වන මුදලට වඩා කෘතිම කඩදාසියේ මුද්‍රණයේ දී වැඩිපුර වැය වූ මුදල රු. 128,939,700 ක් වීම.<br><br>මෙය ආදර්ශ ව්‍යාපෘතියක් ලෙස ක්‍රියාවට නංවා ඇති බව හා වසර 5ක් තුල විෂය නිර්දේශය වෙනස් වීමක් නොවන නිසා හා අවුරුදු 8ක් භාවිතා කළ හැකි බැවින් නැවත නැවතත් මුද්‍රණය කිරීමක් සිදු නොවීම තුල මෙහි උපයෝගීතාවය ඉහළ මට්ටමක පවතින බව ප්‍ර.ග.නි. පැවසීය.</td>
<td>පෙළ පොත් මුද්‍රණයට වාර්ෂිකව වැයවන මුදල අඩුකර ගැනීමේ පියවරක් ලෙස තෝරාගත් පෙළපොත් කිහිපයක් නියාමන ව්‍යාපෘතියක් ලෙස කෘත්‍රිම කඩදාසිවල මුද්‍රණය කිරීමට අධ්‍යාපන අමාත්‍යාංශයේ පැවති සාකච්ඡාවකදී යොජනා විය. එම පෙළපොත් ඉදිරියට වසර 5ක් මූලිකව පරිශීලනය කල හැකි වීමේ දී විවිධ ශීර්ෂ යටතේ වැයවන මිළ ප්‍රමාණය අවම කරගැනීමටත් සිසුන්ගේ භූගෝල විද්‍යා විෂයයේ ඉගෙනුම් ක්‍රියාවලිය ගුණාත්මක මට්ටමින් සංවර්ධනය කිරීමේ අරමුණු මූලිකවත් අමාත්‍ය මණ්ඩල පත්‍රිකා අංක 16/1219/742/026 මගින් 2017 වර්ෂය සඳහා මුද්‍රණය කෙරෙන පෙළපොත් වලින් කොටසක් නියාමන ව්‍යාපෘතියක් ලෙස කල් පවතින කෘතිම කඩදාසියෙන් මුද්‍රණය කිරීමට අමාත්‍ය මණ්ඩල සංදේශය හරහා යෝජනා විය.<br><br>07 ශ්‍රේණිය භූගෝල විද්‍යාව සිංහල මාධ්‍ය, දෙමළ මාධ්‍ය, ඉංග්‍රිසි මාධ්‍ය වශයෙන් සාමාන්‍ය කඩදාසියේ මුද්‍රණය කිරීමේදි ඉදිරිපත් වූ අවම මිළ සහ කෘතිම කඩදාසියේ ඉදිරිපත් වූ මිල ගණන් පහත සඳහන් පරිදි වේ.<br><br>
<table>
<tr><th>පොත</th><th>සාමාන්‍ය කඩදාසි (2016 ජූනි තිබූ මිල</th><th>කෘතිම කඩදාසි (2016 දෙසැම්බර් තිබූ මිල</th><th>වෙනස</th><th>ප්‍රතිශතය</th></tr>
<tr><td></td><td>රු</td><td>රු</td><td>රු</td><td>රු</td></tr>
<tr><td>සිංහල මාධ්‍ය</td><td>45.69</td><td>305.55</td><td>259.86</td><td>568.75%</td></tr>
<tr><td>දෙමළ</td><td>69.52</td><td>317.00</td><td>247.48</td><td>355.98%</td></tr>
</table>
</td>
</tr>
</table>

| | | | | |
|---|---|---|---|---|
| මාධ්‍ය | | | | |
| ඉංග්‍රීසි මාධ්‍ය | 43.54 | 290.00 | 246.46 | 566.05% |

එහෙත් සාමාන්‍ය කඩදාසියෙන් එම පොත වර්ෂයෙන් වර්ෂය මුද්‍රණය කිරීමේදී මිළ ගණන් ඉහළ යාමට පහත සාධක බලපායි.

i. සාපේක්ෂව රුපියලේ අගය අවප්‍රමාණය වීම, කඩදාසි මෙට්‍රික් ටොන් 01ක ආනයන මිල ඩොලර් 200ට වඩා ප්‍රමාණයකින් විටින් විට ඉහළ යාම

ii. මුද්‍රණ අමුද්‍රව්‍ය මිල ඉහළ යාම.
උදා- ලැමිනේටඩ් වාර්ණිෂ් යෙදීමේ වැයවීම් වර්ෂයෙන් වර්ෂයට සිදු කිරීමේ දී ද අමුද්‍රව්‍ය මිල ගණන් වැඩි වීම

iii. පොත්වල ප්‍රමාණයට සාපේක්ෂව මිල වැඩි වීම.

නියාමන ව්‍යාපෘතිය යටතේ කෘතිම කඩදාසියෙන් පොත නිෂ්පාදනය කිරීම යටතේ ගෙන ඇති ක්‍රියාමාර්ග නිසා නිෂ්පාදිත වියදම් අඩු විය.

i. භූගෝල විද්‍යාව සිංහල, දෙමළ, ඉංග්‍රීසි මාධ්‍ය යටතේ මෙම පොත් තුන 2018, 2019, 2020 යන වර්ෂයන් වෙනුවෙන් මිළ ගණන් කැඳවා නොමැති අතර 2017 වර්ෂයේ දී නියාමන ව්‍යාපෘතිය හරහා ලබා දුන් මෙම පෙළපොත පාසල් පද්ධතියේ පරිශීලනය වීම නිසා වර්ෂයෙන් වර්ෂයට මෙම පොතට අලුතින් නිෂ්පාදිත වියදමක් වැය වී නොමැත.

ii. කිසියම් පොතක් සාමාන්‍යයෙන් නිෂ්පාදනය කිරීමේ දී සිදු කරන මූලික උපදේශන රුස්වීම්, වැඩමුළු පැවැත්වීම්, පරිවර්තන ගාස්තු, සංශෝධන ඇතුළත් කිරීමේ සැසි, මුද්‍රණය වන අතරේ මුද්‍රණාල අධීක්ෂණය, කාර්ය මණ්ඩල හා ගබඩා සේවක වැටුප්, මුද්‍රණ කටයුතු සඳහා වන වියදම් මෙම කෘතිම කඩදාසි නිෂ්පාදනය වීමත් සමඟ සිදු වී නොමැත.

ඩොලරය අගය ඉහළ යාම, කඩදාසි මිල වැඩි වීම මත ඉහළ යා හැකි මිල උපකල්පනය -
(ශක්‍යතා අධ්‍යයනයේ දී ඉදිරිපත් වූ මිල විශ්ලේෂණ පදනම)

| **මාධ්‍යය** | **පොතක් සාමාන්‍ය කඩදාසියේ මුද්‍රණය සඳහා දැරිය යුතු පිරිවැය** | | | | | |
|---|---|---|---|---|---|---|
| | **2016 මිල** | **2017 මිල** | **ඉදිරි වර්ෂ සඳහා අපේක්ෂිත මිල** | | | |
| | | | 2018 | 2019 | 2020 | 2021 |
| | රු. | රු. | රු. | රු. | රු. | රු. |
| සිංහල | 49.69 | 120/- | 150.8 | 200/- | 250/- | 325/- |
| දෙමළ | 69.52 | 125/- | 160/- | 210/- | 260/- | 335/- |
| ඉංග්‍රීසි | 43.54 | 80/- | 100/- | 105/- | 115/- | 130/- |

එහෙත් කෘතිම කඩදාසි භාවිතයෙන් පොත් සම්පාදනයේ දී
වසර 5 සඳහාම මුද්‍රණය වන්නේ 2017 වර්ෂයේ දී වැය වූ මිල ගණන් පමණි.එම නිසා කෘතිම කඩදාසියෙන් එක් පොතක් මුද්‍රණය කිරීම වෙනුවෙන් දරන පිරිවැය වසර 5 ක් වෙනුවෙන් ම එක් වරකි.අතිරේක ගාස්තු හා අතිරේක නිෂ්පාදන වියදම් නොමැත.

කෘතිම කඩදාසියෙන් මුද්‍රණය කිරීම රජයට දැරීමට සිදුවවන වියදම අතිරේක පිරිවැයක් හෝ අලාභයක් ලෙස නිරීක්ෂණය වී ඇත්තේ එක් වසරක (2016) සාමාන්‍ය කඩදාසියේ පොතක් මුද්‍රණය කිරීමට යන වියදම පදනම් කරගෙන ඇති නිසාය.එහෙත්

| | | |
|---|---|---|
| | | 2017 වර්ෂයේ පොතක් මුද්‍රණය කිරීමට යන වියදම රු.49.69 සිට රු.120 දක්වා වැඩි වී ඇත.තවද බෙදාහැරීම් වියදම්ද වසරක් පාසා වැඩි වනු ඇත.එම සියලු වැය සලකා බලද්දී කෘතිම කඩදාසියට වැය වූ මුදලින් රජයට අලාභයක් නොවන පරිදි සම්පත් උපයෝජනය විය.<br><br>මේ සම්බන්ධව ගනු ලැබූ තවත් ක්‍රියාමාර්ගයක් වනුයේ අනාගතයේ දී කඩදාසිවලින් තොර ගුණාත්මක පාසල් ද්‍රව්‍ය ප්‍රවර්ධනය කිරීමේ වැඩ පිළිවෙල යටතේ 2019 වර්ෂය සඳහා 11 ශ්‍රේණිය විද්‍යාව ඉගෙනුම් උපකරණය නිෂ්පාදනය සිදු කර ශිෂ්‍යන්ගේ ඉගෙනුම් කටයුතු සඳහා බෙදාදීමයි.<br><br>ඊට අමතරව 6 ශ්‍රේණිය ගණිතය, ඉංග්‍රීසි විෂයයන් සඳහා ද e-learning ඉගෙනුම් ද්‍රව්‍ය නිෂ්පාදනය සිදු කර බෙදාහැරීමට කටයුතු ක්‍රියාත්මක වෙමින් පවතී.<br><br>07 ශ්‍රේණියේ භූගෝල විද්‍යා පෙළපොත් 03ක නියාමන ව්‍යාපෘතිය නිසා කිසිදු අයුරකින් මූල්‍ය වැඩිවීමකට හේතු නොවන පරිදි රජයට අවාසි සහගත නොවන පරිදි නිෂ්පාදනය කරමින් සිසුන්ගේ ගුණාත්මක අධ්‍යාපනයට දායක වන අයුරින් පාසල් පද්ධතියේ එම පොත පරිශීලනය කරමින් ක්‍රියාත්මක කිරීමට වර්තමානයේදී ද ක්‍රියාමාර්ග සලස්වා ඇත. |
| 16 . | **2006/01/01 දිනට පසු බඳවා ගෙන තිබූ රසායනාගාර සේවක හා පුස්තකාල සේවකයින් අදාළ තනතුරුවල III ශ්‍රේණියෙහි තබා වැටුප් පරිමාණයේ ආරම්භක පියවරහි තැබිය යුතු වුවද, II ශ්‍රේණියෙහි තබා 12 වන වැටුප් පියවර ලබා දී තිබුණු අතර මුරකරු හා ගිලන්හල් සේවක තනතුරු සඳහා ද ආරම්භක වැටුප් පියවර වෙනුවට 12වන වැටුප් පියවර ලබා දී තිබීම.**<br>වර්තමානයේ දී කාර්ය මණ්ඩල විශ්ලේෂණයක් සිදුකෙරෙමින් පවතින බව අනාවරණය වූ අතර මේ පිළිබඳ සම්පූර්ණ වාර්තාවක් මසක් තුළ ලබා දෙන ලෙස කාරක සභාව නියෝග කළේය | විගණකාධිපති විසින් ලබාදුන් උපදෙස් පරිදි ප්‍රාථමික ශිල්පීය නොවන සේවක ගණයේ තනතුරුධාරීන් හට වැඩිපුර ගෙවන ලද වැටුප් අය කර ගැනීම සඳහා ක්‍රියාකරමින් සිටියද ජාතික වැටුප් හා සේවක සංඛ්‍යා කොමිෂන් සභාවේ ලේකම්ගේ අංක NSCC/05/38/SA 1-iii හා 2018.12.20 දිනැති ලිපියට අනුව පුස්තකාල සේවක, රසායනාගාර සේවක, මුරකරු හා ගිලන්හල් සේවක තනතුරුධාරීන් PL-1 වැටුප් පරිමාණයේ 12 වැනි පියවරට බඳවා ගැනීම රාජ්‍ය පරිපාලන චක්‍ර ලේඛ අංක 06/2006 හි නියමයන්ට අනුකූල නොවන බැවින්ද, වැඩියෙන් ගෙවූ වැටුප් නැවත අය කර ගැනීම නතර කරන ලෙස දන්වා ඇත.<br><br>ඒ අනුව අමාත්‍යාංශයේ අංක ED/05/67/12/පොදු/11හා 2018.12.20 දිනැති ලිපිය මගින් අදාළ තනතුරුධාරීන්ගේ වැඩිපුර වැටුප් අයකිරීම නවත්වන ලෙසත් මීට අදාළව ජාතික වැටුප් හා සේවක සංඛ්‍යා කොමිෂන් සභාවේ ලේකම්ගේ නිර්දේශ ක්‍රියාත්මක කළයුතු බවත් සියළුම කලාප අධ්‍යාපන අධ්‍යක්ෂකවරුන්, පීඨාධිපතිවරුන්, ගුරු විද්‍යාල විදුහල්පතිවරුන් හා ගුරු මධ්‍යස්ථාන කළමනාකරුවන් දැනුවත් කරන ලදී.<br><br>තවද සේවකයින්ගේ පත්වීම් ලිපියේ 11 වන ඡේදය සංශෝධනය කර ඔවුන් නිවැරදි වැටුප් තලයේ පිහිටුවා පත්වීම් ලිපි නිකුත් කොට ඇත. (ඇමුණුම 02) |
| 17 | **වැසී ගිය පාසැල් හා පාසැල් හැර යන සිසු සංඛ්‍යාව, එක් සිසුවෙකුට වෙන් කරන මුළු වර්ග අඩි ප්‍රමාණයක් හා ශිෂ්‍ය ගුරු අනුපාතය**<br><br>මේ පිළිබඳ පර්යේෂණයක් සිදු කර වාර්තාවක් ලබා දෙන ලෙස කාරක සභාව ප්‍ර.ග.නි./ ග.නි. හට නියෝග කල අතර පාසැල්වල පවතින වාහන පිළිබඳ දත්ත පද්ධතියක් අමාත්‍යාංශ | පාසල් සංගණන තොරතුරු භාවිතයෙන් අවශ්‍ය සංඛ්‍යා ගණනය කළ හැකි බැවින් 2018 නවතම දත්ත පදනම් කර ගනිමින් ගණනය කිරීම සඳහා අවශ්‍ය දත්ත විශ්ලේෂණය සිදු කරමින් පවතී.<br><br>එක් ශිෂ්‍යයෙකුට වෙන්ව ඇති වර්ග අඩි ප්‍රමාණය ශිෂ්‍ය සංඛ්‍යාව හා පාසලේ ස්වභාවය අනුව ප්‍රභේද කර දත්ත විශ්ලේෂණය කර ඇත. |

| | | |
|---|---|---|
| | මට්ටමින් තබා ගැනීමේ වැදගත්කමද අවධාරණය කළේය. | පාසල් සතු වාහන පිළිබඳ තොරතුරු ලබා ගැනීම සඳහා අවශ්‍ය කටයුතු සිදු කරමින් පවතී. |
| 18. | **ගුරු අධ්‍යාපනඥයින්ගේ සේවය හා ගුරු උපදේශක සේවා ව්‍යාවස්ථාවෙහි වර්තමාන තත්ත්වය**<br>ගුරු උපදේශක සේවා ව්‍යාවස්ථාවට අදාළ ඉදිරි කටයුතු සඳහා වැටුප් හා සේවක කළමනාකරණ මණ්ඩලයට හා අනුමැතිය සඳහා රාජ්‍ය සේවා කොමිෂන් සභාවට හැකි ඉක්මනින්ම ඉදිරිපත් කරන බවත් ගුරු අධ්‍යාපනඥයින්ගේ සේවය පිළිබඳව රාජ්‍ය සේවා කොමිෂන් සභාව අනුමැතිය ලබා දී ඇත්තේ අමාත්‍ය මණ්ඩලය අනුමැතියක් ලබා ගෙන ක්‍රියාත්මක කරන ලෙස බවද ප්‍ර.ග.නි. පැවසීය. | රාජ්‍ය සේවා කොමිෂන් සභාවේ සහ ආයතන අධ්‍යක්ෂ ජනරාල්ගේ නිරීක්ෂණ හා නිර්දේශ ලැබී ඇත. එම කරුණු සමඟ නැවතත් වෘත්තීය සමිති හා ප්‍රධාන කොමසාරිස් (ගුරු අධ්‍යාපන) සමඟ සාකච්ඡා කරන ලද අතර එහිදී ඇතිවූ එකඟතාවය මත සැකසූ අවසන් කෙටුම්පත රාජ්‍ය සේවා කොමිෂන් සභාව වෙත යැවීමට කෙටුම්පත් කර ඇත. |

ඇමුණුම 01

## විනය ගොනුවල වර්තමාන තත්ත්වය (2019.02.28 දිනට)

| විස්තරය | | එකතුව | මුළු එකතුව |
|---|---|---|---|
| මූලික විමර්ශන/පරීක්ෂණ පැවැත්වෙන | | 135 | 135 |
| විධිමත් විනය පරීක්ෂණ පැවැත්වෙන | අධ්‍යාපන | 21 | 48 |
| | ESC | 24 | |
| | රාජ්‍ය පරිපාලන | 3 | |
| චෝදනා පත්‍ර නිකුත් කර ඇති(විධිමත් විනය පරීක්ෂන ආරම්භ වී නොමැති) | අධ්‍යාපන | 8 | 19 |
| | ESC | 9 | |
| | රාජ්‍ය පරිපාලන | 2 | |
| චෝදනා පත්‍ර කෙටුම්පත් වෙත යොමු කර ඇති | අධ්‍ය.සේ.කමිටුව | 5 | 09 |
| | රාජ්‍ය පරිපාලන | 4 | |
| විනය නියෝග නිකුත් කිරීම සම්බන්ධ කටයුතු සිදුවන | අධ්‍යාපන | 6 | 17 |
| | ESC | 6 | |
| | රාජ්‍ය පරිපාලන | 5 | |
| විනය නියෝගට එරෙහි අභියාචනා සම්බන්ධ කටයුතු සිදුවන | රා.පරි. | 12 | 12 |
| වෙනත් | නඩු පැවැත්වෙන | 45 | 45 |
| | විගණන/මූ.රෙ.පරීක්ෂණ සිදුවන | 25 | 25 |
| | මූ. වි. නි. ක්‍රියාත්මක වෙමින් පවතින | 76 | 76 |
| | රා. සේ. කො. උපදෙස් පැතීම | 6 | 6 |
| | පොලිස්පති/අල්ලස් අපරාධ | 10 | 10 |
| පොදු ගොනු ( විදුහල්පති/කලාප වාර්තා කැඳවන) | | 3 | 3 |
| **එකතුව** | | 405 | **405** |

අධ්‍යාපන අමාත්‍යාංශය
கல்வி அமைச்சு
Ministry of Education

'ඉසුරුපාය', බත්තරමුල්ල, ශ්‍රී ලංකාව.
'இசுருபாய', பத்தரமுல்ல, இலங்கை.
'Isurupaya', Battaramulla, Sri Lanka.
+94112785141-50 +94112784846
isurupaya@moe.gov.lk www.moe.gov.lk

මගේ අංකය / எனது இல. / My Ref. ED/05/67/12/පොදු/11/පත්වීම්
ඔබේ අංකය / உமது இல. / Your Ref.
දිනය / திகதி / Date 2018.10.27

විදුහල්පති මගින්,

ඩබ්.සී.කුමාරි,

පුස්තකාල සේවක,

කෑ/කෑගලු බාලිකා ම.වි..

<u>පුස්තකාල සේවක තනතුරට පත්කිරීම</u>

උක්ත කරුණට අදාළව ඔබ වෙත නිකුත් කර ඇති මගේ අංක **ED/5/67/12/3/8(3)14** හා **2007.07.01** දිනැති පත්වීම් ලිපිය හා බැඳේ.

02. ජාතික වැටුප් හා සේවක සංඛ්‍යා කොමිෂන් සභාවේ ලේකම්ගේ අංක NSCC/2/6/6/4/1/9 හා **2009.05.18** දිනැති ලිපිය හා ආයතන අධ්‍යක්ෂ ජනරාල්ගේ අංක EST-3/RECRU/06/89M2 හා **2011.08.17** දිනැති ලිපිය අනුව,උක්ත පත්වීම් ලිපියේ **11** වන ඡේදය පහත පරිදි සංශෝධනය කර ඇති බව කාරුණිකව දන්වා සිටිමි.

"**2007.08.24** දිනැති රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ අංක **6/2006(IV)** අනුව මෙම තනතුරට හිමි වැටුප් පරිමාණය **11,730 -10X120 - 10X130 - 10X145 - 12X160 - 17,600/-**( පී එල් 1-2006 ඒ) වේ.ඔබ මෙම වැටුප් පරිමාණයේ ආරම්භක වැටුප් පියවර වන රු.**11,730**/-ක මාසික වැටුප මත පිහිටුවනු ලැබේ.මෙයට අමතරව රජයේ නිලධරයන් වෙත රජය විසින් කලින් කලට ගෙවනු ලබන වෙනත් දීමනාවන් ද ඔබට හිමිවේ."

03. එමෙන්ම උක්ත කරුණ සම්බන්ධයෙන් ඔබ වෙත නිකුත් කර ඇති මගේ අංක **ED/5/67/12/3/8(3)14** හා **2007.07.01** දිනැති පත්වීම් ලිපියේ සඳහන් අනෙකුත් කොන්දේසි නොවෙනස්ව පවතී.

ඩී.කුසලානි ද සිල්වා
ජ්‍යෙෂ්ඨ සහකාර ලේකම්(ආයතන)

අත්/කලේ සුනිල් හෙට්ටිආරච්චි
අධ්‍යාපන ලේකම්

පිටපත්-

1. විගණකාධිපති
2. විශ්‍රාම වැටුප් අධ්‍යක්ෂ ජනරාල්
3. ප්‍රධාන ගණකාධිකාරී
4. පළාත් අධ්‍යාපන අධ්‍යක්ෂ - සබරගමුව
5. කලාප අධ්‍යාපන අධ්‍යක්ෂ - කෑගල්ල (ඉහත 02 ඡේදය පරිදි වැටුප සංශෝධනය කිරීම සඳහා)
6. විදුහල්පති/පීඨාධිපති - කෑ/කෑගලු බාලිකා ම.වි.
7. පෞද්ගලික ලිපි ගොනුව



ගරු අමාත්‍යතුමා +94112784832
ලේකම් +94112784811